# නෙළුම් වැව උණුදිය උල්පත් නරඹමු.

මනෝජා ජයසේකර
වැඩසටහන් සහකාර, පරිසර අමාත්‍යාංශය

පරිසරය පිළිබඳ ලොව විද්වතුන් විවිධ අර්ථ කථනයන් ඉදිරිපත් කරනු ලබන නමුත් බෙහෙවින් සරල ලෙස ඔබ එය වටහා ගන්නේ නම් පරිසරය අපෙන් දුරස් නොවනු ඇත. තමා හැර තමා ජීවත් වන්නා වූ වටපිටාව පරිසරය ලෙසින් සලකා බලනු ලැබුවත් එහි ඇති විවිධාංගීකරණය තුල අපේ සිත් අදටත් ඈත අතීතයේත්, අනාගතයේත්, අතරමං කොට ඇත. එනම් මෙකී විවිධත්වය හමුවේ පරිසරයේ කොටස්කරුවන් වන අපි දේශාන්තරණය කරන්නෙමු. සංචාරය කරන්නෙමු. පරිසර රසය විඳින්නෙමු. බලන්න බොහෝ දේ ඇති නිසා අපි ඇවිදින්නෙමු. මෙය ශ්‍රී ලාංකීය අපට මෙන්ම ලොව සිව් දෙසින් සංචාරය කරන්නන්ට ද පොදු වූවකි. එහෙත් මේ සෑම සංචාරයකදීම අපේ සිත් නෙත් පිනවන කඳුහෙල් තුරුලතා වලින් සැදුම්ලත් දර්ශනීය ස්ථාන මෙන්ම සාගර ඇල දොල හා සංස්කෘතික පරිසරයන් වන නටබුන්, සිතුවම් ග්‍රහණය කර ගන්නෙමු. එහෙත් පාරිසරිකව හා විද්‍යාත්මකව වැදගත් වන උණු දිය උල්පත් පිළිබඳ ජනතාව සතු දැනුම අල්ප බැවින් ඒ පිළිබඳ ඔබ තුල දැනීමක් සමගින් ශ්‍රී ලංකාවේ වැඩි අවධානයට පාත්‍ර නොවූ නෙළුම් වැව ජලාශයේ උණුදිය උල්පත් පිළිබඳ විමසා බැලීමට මෙම ලිපියෙන් අපේක්ෂා කෙරෙයි. ශ්‍රී ලංකාව ද උණුදිය උල්පත්වලින් සංයුක්ත වූ රටකි.



නෙළුම් වැව

ශ්‍රී ලංකාවේ දකුණු දිග වෙරළ තීරය වන හම්බන්තොට සිට ත්‍රිකුණාමලයට උතුරින් ගෝමරන්කඩවල දක්වා බිම් තීරයේ උණුදිය උල්පත් දහයක් හමු වේ. මෙහි ඇති විශේෂත්වය නම් උණුදිය උල්පතින් උල්පතට වෙනස් උෂ්ණත්වයන් පැවතීමයි.

| | උණුදිය උල්පත | උෂ්ණත්වය (සෙ. අංශක) |
|---|---|---|
| 1. | කිවුලේගම (ජයන්ති වැව) | 34 |
| 2. | රන්කිහිරිය (ගෝමරන්කඩවල) | 42 |
| 3. | කින්නියා (ත්‍රිකුණාමලය) | 42 |
| 4. | මරන්ගල (පදියතලාව) | 44 |
| 5. | මහපැලැස්ස (සූරිය වැව) | 44 |
| 6. | වහව (අම්පාර) | වාර්තා නොවේ |
| 7. | මුතුගල්වෙල (ගුරු කුඹුර) | වාර්තා නොවේ |
| 8. | කපුරැල්ල | 55 |
| 9. | මහඔය | 56 |
| 10. | නෙළුම් වැව | 62 |

ශ්‍රී ලංකාවේ ප්‍රධාන විපරිත පාෂාණ සංකීර්ණ දෙකක් වන කඳුබිම් සංකීර්ණය හා විජයානු සංකීර්ණය යන පාෂාණ කලාප දෙකේ මායිමට ආසන්නව මෙකී උල්පත් දහයම පිහිටා ඇත. මේවා පුරාතනයේ සක්‍රියව පැවතියත් වර්තමානයේ අක්‍රිය ලෙස පවතියි. ලොව ඇති ප්‍රධාන උණුදිය උල්පත් මෙන්ම ශ්‍රී ලංකාවෙන් හමුවන උණුදිය උල්පත් ද පෘථිවි කබොලේ ඇති තල මායිම්වලට ආසන්නවම පිහිටා ඇත. ශ්‍රී ලංකාව සක්‍රිය තල මායිම් ආසන්නයේ පිහිටා නැති නමුත් ශ්‍රී ලංකාවේ හමුවන ඉහත කී පාෂාණ සංකීර්ණ දෙක දැනට අක්‍රියව පැවතියත් ඈත අතීතයේදී සක්‍රිය මායිම්ව පැවතෙන්නට ඇතැයි අනුමාන කල හැකි ලෙසින් ඒ ආසන්නයේ පොළොව අභ්‍යන්තරයේ දැනට ද තරමක උණුසුමක් පවතින පාෂාණ හමුවනු දැකිය

හැකියි. සාමාන්‍යයෙන් පෘථිවිය මතුපිට සිට පෘථිවි අභ්‍යන්තරයට වන්නට පාෂාණවල උෂ්ණත්වය කිලෝ මීටරයකට සෙල්සියස් අංශක 30 ක ප්‍රමාණයකින් වැඩිවනු දැකිය හැකිය.

උණුදිය උල්පත් ඇති වීමට ප්‍රධාන හේතුව වන්නේ පෘථිවි මතුපිට ඇති ජලය හා වර්ෂා ජලය පෘථිවි අභ්‍යන්තරයට කාන්දු වීමෙන් පසුව පෘථිවි අභ්‍යන්තරයේ ඇති භූ තාප ශක්තිය අධික ලෙස අවශෝෂණය කර ගැනීමයි. ඉන්පසු මෙසේ තාපය අවශෝෂණය කර ගත් ජලය තාප හානියක් සිදු වීමට පෙර පෙරලා මතුපිටට ගලා එයි. තවද පෘථිවි කබොල්ලේ තල මායිම්වල සිදු වන භූ කාරක ක්‍රියා නිසා ද අභ්‍යන්තරයේ උෂ්ණත්වය වැඩි වේ. එබැවින් බහුල වශයෙන් උණුදිය උල්පත් හමු වන්නේ ද මෙවැනි මායිම් තුලිනි. මෙසේ පොළොවේ ඇති ගැඹුරු විභේදන ඔස්සේ අභ්‍යන්තරයට කාන්දු වන ජලය මෙවැනි උණුසුම් පාෂාණයන්හි ගැටීමෙන් ඒවායේ ඇති තාපය අවශෝෂණය කරගෙන උණුදිය උල්පත් ලෙසින් පොලොව මතුපිටට ගලා එයි.



**උණුදිය උල්පත්**

නෙළුම් වැව ජලාශයේ හමුවන උණුදිය උල්පත් ද මෙවැනි සංසිද්ධි දාමයක ප්‍රතිඵලයක් ලෙස අනුමාන කල හැකියි. මෙම උණුදිය උල්පතට ආසන්නයේ ඉතා ගැඹුරට සිරස්ව විහිදෙන විභේදනයන් හඳුනාගෙන ඇති අතර මතුපිට මැටි හා කිරිමැටිවලින් පිරී පවතින බවද සොයාගෙන ඇත. උණුදිය උල්පත් මාර්ගයට ඔබ්බෙන් ජීර්ණය වූ පාෂාණ තුලින් ඉහළට උණුසුම් ජලය ඇදී නෙළුම් වැව මඩ තට්ටුව තුළින් මතු පිටට ගලා එයි. මෙහි සාමාන්‍ය උෂ්ණත්වය 62 C කි. දැනට ශ්‍රී ලංකාවේ හමු වී ඇති වැඩිම උණුසුම ඇති උණුදිය උල්පත මෙය වේ. 2009 වසරේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පිළිසකර කර ඇති මෙම නෙළුම් වැව ජලාශය ඊට පෙර උණුදිය සහිතව මඩ වගුරක් ලෙසින් පැවති අතර ප්‍රදේශවාසීන්ගේ ද සහාය ඇතිව පිළිසකර කිරීමෙන් පසු සංචාරකයින්ගේ ද අවධානයට යොමු වී ඇත.



**බෝට්ටු සවාරියක් සඳහා**

ඔබද සුන්දර වටපිටාවක් සමගින් බෝට්ටු සංචාරයක් විඳ ගනිමින් එහි ආස්වාදය ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ නම් මීලඟ විවේකය ඒ සඳහා සැලසුම් කිරීමද උචිතය. මෙම නෙළුම් වැව ජලාශය මැද පිහිටි දූපතෙහි උණු වතුර ළිං වලට අමතරව විල් කුකුළන් හංසයන් වැනි පක්ෂි විශේෂ කොක්කුන් මෙන්ම නොයෙක් වැව් ඉවුරු ආශ්‍රිත පක්ෂීන් ද නැරඹිය හැකිය. ජලාශයේ වතුර මට්ටම වැඩි වන විටදී මෙහි ඇති උණු දිය උල්පත්වල උණුසුම ද වැඩි වන බව ප්‍රදේශවාසීන් ප්‍රකාශ කරයි.

තව දුරටත් මෙම ජලාශයේ ස්නානය කිරීමට ද හැකි නාන තොටක් පවතින අතර මිනිසුන් උණු වතුර ළිංවල උණුසුම් ජලය නෑමට ද පැමිණෙති. විද්‍යාත්මකව සලකා බැලූ කල උණුදිය උල්පත්වල අන්තර්ගත වන ඉහල ඛනිජ ලවණ ප්‍රමාණය නිසා එය ස්නානය කිරීමෙන් චර්ම රෝග, වාත ආබාධ වැනි රෝගී තත්ත්වයන් සුව වීමේ ප්‍රවණතාවයක් ඇති බව ද විශ්වාස කරයි. ජනප්‍රවාද වලට අනුව දිඹුලාගලට ආසන්නයේ පිහිටි මෙම උණුදිය උල්පත් රාවණා රජු යුගයේදී පොකුණක් ලෙස භාවිතා කර ඇතැයි විශ්වාස කරයි. උණුදිය උල්පත් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නැගෙනහිර දේශාංශ 81$^{0}$12’’ ත් උතුරු අක්ෂාංශ 7$^{0}$53' -03’’ අතර වන අතර මුහුදු මට්ටමේ සිට උස මීටර 45 කින් පිහිටා ඇත. ඒ වෙත පිවිසීම සඳහා පොළොන්නරුව මඩකලපුව මාර්ගයේ 56 වන කිලෝමීටර කණුව අසල සෙවණපිටිය මංසන්ධියෙන් දකුණට හැරී නෙළුම්වැව මාර්ගයේ පැමිණි විටදී නෙළුම් වැව ජලාශය හමු වේ. සුන්දරත්වය සමගින් ධීවර ආර්ථික ශක්තිය සඳහා උරදෙන මෙම නෙළුම් වැව ජලාශය ප්‍රදේශවාසීන්ට සුවිශේෂී ස්ථානයකි. එබැවින් එය රැකීම ද අපගේ පරම යුතුකමකි.

චමත්කාර ජනක සොබාදහමක අසිරිය සමගින් අපූරු නිර්මාණයක රසවිඳ ගනිමින් ඔබත් පරිසර හිතකාමී සංචාරකයෙකු වීමට අදහස් කරන්නේ නම් දැනුම රැගෙන පා පිය සටහන් පමණක් මෙම බිමේ ඉතිරි කර ඒමට මෙවර විවේකය සැලසුම් කරගන්නා මෙන් මතක් කර දෙනුයේ බලන්න බොහෝ දේ ඇති නිසා මිනිසාට ඇවිදින්නට දෙපා උරුම කර ඇති බැවිනි.